ශ්‍රී ලංකා නීතිඥ සංගමය
இலங்கைச் சட்டத்தரணிகள் சங்கம்
BAR ASSOCIATION OF SRI LANKA

2021 අගෝස්තු 1 වනදා

ජනරාල් ශවේන්ද්‍ර සිල්වා,
කොවිඩ්-19 කාර්ය සාධන බලකායේ සභාපති,
ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ
ශ්‍රී ලංකා යුද හමුදාපති,
යුද හමුදා මූලස්ථානය,
කොළඹ 01

වෛද්‍ය අසේල ගුණවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ 10

මහත්වරුනි,

**සංචරණ සීමා ඉවත්කිරීමේදී සෞඛ්‍ය මාර්ගෝපදේශවලට දැඩිව අනුකූල වීමේ වැදගත්කම**

මේ වන විට සිදුකරමින් තිබෙන එන්නත්කරණ වැඩසටහනේදී සහ කෝවිඩ්-19ට එරෙහිව සටන් කිරීමේදී රජයේ, සෞඛ්‍ය සේවකයන්ගේ හා ආරක්ෂක හමුදාවල කාර්යභාරය ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ඇගයීමට ලක්වේ. එහිදී ඔබ දෙපොළ විසින් දරනු ලබන වගකීම ද ප්‍රශංසාත්මකය.

පසුගිය දින කීපයේදී ශ්‍රී ලංකාව විසින් දිනකට ලබාදෙන ලද එන්නත් සංඛ්‍යාව ලෝකයේ වැඩිම අගයන් අතරට එක්වන බව අතරම, අඛණ්ඩව සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීමේ සහ සංචරණ හා වෙනත් සීමා ඉවත් කිරීමේදීද ප්‍රවේශමෙන් කටයුතු කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකා නීතිඥ සංගමය අවධාරණය කරයි.

වයිරසයේ ව්‍යාප්තිය සම්බන්ධ පාලනය තහවුරු කිරීම සඳහා සෞඛ්‍ය බලධාරීන් කටයුතු කිරීමේදී ස්වාධීන සෞඛ්‍ය විශේෂඥවරුන්ගේ අදහස් හා යෝජනා අවධානයෙන් සලකා බැලීම අතිශය වැදගත් බව ද ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ අදහසයි.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් මෙම නිරීක්ෂණ සිදුකරනු ලබන්නේ පසුගිය දින කීපය තුළ වාර්තා වූ කෝවිඩ්-19 ආසාදිතයන්ගේ වැඩිවීම, දිනපතා සැලකිය යුතු මරණ සංඛ්‍යාවක් සිදුවීම සහ සෞඛ්‍ය අංශ වෙත මේ සම්බන්ධව එල්ල වන දැඩි බලපෑම සැලකිල්ලට ගනිමිනි.

විශේෂයෙන්ම ඩෙල්ටා ප්‍රභේදය ඇතුළුව ආසාදනය පැතිරීම සහ ජන ජීවිතයට එම නව ප්‍රභේදය විසින් එල්ලකරනු ලබන තර්ජනය පිළිබඳ ශ්‍රී ලංකාවේ හා විදේශීය වෛද්‍ය සංවිධාන කීපයක් විසින් දැඩි අවධානය යොමු කර ඇති බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය සඳහන් කරන්නට කැමතිය.

නිසි පරිදි මුහුණු ආවරණ පැළඳීමට හා ශාරීරික දුරස්ථභාවය පවත්වාගැනීමට අසමත් වීම මෙන්ම සෞඛ්‍ය මාර්ගෝපදේශවලට නිසි පරිදි අනුගත වීමට අසමත් වීම හේතුවෙන් රෝගය වැළඳීමේ අවදානම ඉහළ යයි.



| President | Deputy President | Secretary | Treasurer | Assistant Secretary |
| --- | --- | --- | --- | --- |
| Saliya Pieris PC | Anura Meddegoda PC | Rajeev Amarasuriya | Rajindh Perera | Pasindu Silva |

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk

අගුලුලෑම් හා සංචරණ සීමා හේතුවෙන් ජනතාවට හා ජාතික ආර්ථිකයට ඇතිකරනු ලබන දුෂ්කරතා ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් මනාව අවබෝධ කරගෙන තිබේ.

කෙසේ වෙතත්, පොදු ප්‍රවාහනය, පෞද්ගලික රැස්වීම් ඇතුළු සෑම පොදු ක්‍රියාකාරකමකදීම පාහේ සෞඛ්‍ය මාර්ගෝපදේශ හා ආරක්ෂක විධිවිධාන අනුගමනය කළ යුතුය. ඒ අතරතුර රෝගය හඳුනා ගැනීමේ පරීක්ෂණද දැඩිව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය.

අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී මේ සම්බන්ධ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විශේෂඥභාවය රජයට සැපයීමට සංගමය කැමැත්තක් දක්වයි.

මෙයට,

විශ්වාසී,

**ජනාධිපති නීතිඥ සාලිය පීරිස්,**
**සභාපති,**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**

**රජීව් අමරසූරිය,**
**ලේකම්,**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**



| President | Deputy President | Secretary | Treasurer | Assistant Secretary |
| --- | --- | --- | --- | --- |
| Saliya Pieris PC | Anura Meddegoda PC | Rajeev Amarasuriya | Rajindh Perera | Pasindu Silva |

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk